ජාඇල ප්‍රාදේශීය සභාව - 2020
-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

ජාඇල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් විස්තරාත්මක කළමනාකරණ වාර්තාවේ පහත අංක යටතේ සඳහන් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

1.2.2 (ඉ), (ඌ), 1.2.3, 1.2.4, 1.2.6, 1.2.7(අ), (ආ)(ii), (ඇ), 2.2.2 හා 3.4.1

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18.7 හා LGD/10A/4/න.ගි/2019 අංක දරන පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති ලිපිය ප්‍රකාරව සභාව සතු වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකරමින් පවතින බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.103,452,469 කින් වර්ෂයේ කළ ගෙවීම්, අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ සටහන් නොකොට පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් යටතේ දැක්වීමෙන් අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.210,492,335 ක් වූ ප්‍රාග්ධන වියදම් වර්ෂයේ වියදමක් ලෙස අතිරික්තය හෝ ඌනතාවය ගැලපීම සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දැක්වීමෙන් වර්ෂයේ අතිරික්තය හා කෙරිගෙන යන වැඩ වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා ඇති අත ඉතිරි රු.1,323,657 ක්, වත්කම් හා වගකීම් ප්‍රකාශයේ සටහන් අංක 11 යටතේ අතැති මුදල් ලෙස දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | බටුවත්ත උප කාර්යාලය හා පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරිම හා දඹුගම උප කාර්යාලය හා මහජන පුස්තකාල දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා පිළිවෙලින් රු.8,000,000 ක් හා රු.8,000,000 ක් වශයෙන් එකතුව රු.16,000,000 ක් සමාලෝචිත වර්ෂයේ ණයහිමි ලෙස වෙන්කිරිම් සිදුකර වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර 2021 අප්‍රේල් 06 දින වන විටත් ඒ සඳහා ගිවිසුම්ගතවී නොතිබුණි. | කටයුතු කඩිනමින් ආරම්භ කර අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට වූ ගබඩා ණයහිමි ශේෂය, 2020 වර්ෂය සඳහා පමණක් වූ ගබඩා ණයහිමි ශේෂයට සමාන වී තිබූ අතර 2019 වර්ෂයේ ඇනවුම් කර ගබඩාවට ලැබී නොමැති වටිනාකම රු.1,133,025 ක් වූ භාණ්ඩ තිබූ හෙයින් එම වටිනාකමින් ගබඩා ණයහිමියන් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | ගබඩා ණයහිමි ලේඛණය යාවත්කාලීන කරමින් පවතින බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

---

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා ඊට අනුරූපි වාර්තා අනුව දැක්වෙන වටිනාකම් අතර රු.323,953,943 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

1.6.4 අවිනිශ්චිත ගිණුම

--------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1992 වර්ෂයේ සිට පැවත එන රු.236,425 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීම සඳහා පත් කර තිබූ ගිණුම් උපදේශකගේ වාර්තාවට අනුව නීති රීතිවලට එකඟව සමුච්චිත අරමුදලට ගලපා ශේෂය ඉවත් කර ගැනීමට නිර්දේශ කර තිබූ අතර එය පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි | ගිණුම උපදේශකගෙන් ලැබී ඇති වාර්තාව පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇති අතර ඒ සඳහා අනුමැතිය ලද පසු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

1.7 අනුකූල නොවීම්

-----------------

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

------------------------------------------------------------------------

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | තැන්පත් කර වර්ෂ 03-05 ත් අතර වූ රු.11,056,747 ක් හා වර්ෂ 05 ඉක්මවා තිබූ රු. 16,905,882 ක්ද වශයෙන් එකතුව රු27,962,629 ක් වූ මිශ්‍ර තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.70,783,624 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.137,137,461 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

---------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනට රු.8,782,000 ක් වූ කුලී හිඟය, සමාලෝචිත වර්ෂය අවසානයට රු.16,388,000 දක්වා වැඩිවී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට එම හිඟයෙන් අයකර තිබූ මුදල රු. 2,629,669ක් වූ හෙයින් හිඟ අය කිරීම දුර්වල තත්ත්වයක විය. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ගෙන යන බව දන්වමි | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුවේ. |

3.

මෙහෙයුම් සමාලෝචනය

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 හඳුනාගත් පාඩු

------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව එරෙහිව 2450/SPL අංක දරන නඩුවට සභාවේ නියෝජනයක් නොවීම හේතුවෙන් ඒකපාර්ශිකව පැමිණිල්ලේ වාසියට නඩුව තීන්දු කොට තිබුණි. අධිකරණයෙන් 2003 වර්ෂයේදී ගෙවීමට නියම වූ රු.500,000 ක මුදල හා මාසික අලාභ ගාස්තු රු.10,000 ක් ගෙවීම සම්බන්ධයෙන් සහනයක් ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා 2020 වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ගාස්තු රු.4,168,015 දක්වා වැඩිවී තිබූ අතර 2021 මැයි හා අගෝස්තු මාසවල වාරික 03 කින් ගෙවා අවසන් කර තිබීම හේතුවෙන් එම මුදලින් සභාවට පාඩුවක් සිදු කර තිබූ පුද්ගලයන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | අභියාචන නඩුව විභාග වන කාලයටත් අදාලව රු.10,000 බැගින් ගෙවීමට සිදු වීම නිසා මෙම මුදල වැඩි වී ඇති බවත් දන්වමි. | සභාවට වූ පාඩුව වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අය කර ගැනීමට පියවර ගත යුතුවේ. |

3.2 ප්‍රසම්පාදනය

--------------

3.2.1 භාණ්ඩ හා සේවා

------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා125W මර්කරි(ඔස්රම්) විදුලි බල්බ මිලදී ගැනීමේදී අඩුම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් බල්බ 800 ක්, දන්වා තිබූ මිලට වඩා වැඩියෙන් වැඩ අධිකාරිගේ නිර්දේශය මත මිලදීගෙන තිබීම නිසා සභාවට සිදුවූ පාඩුව රු. 33,600 ක් වූ අතර එම බල්බද ප්‍රමිතියෙන් අඩු බව දක්වා නැවත අළුතින් මිල ගණන් කැඳවා එම ආයතනය කලින් මිල ගණන් කැඳවීමේදී දක්වා තිබූ මිලට වඩා වැඩියෙන් බල්බ 2750 ක් මිලදී ගැනීම නිසා සභාවට සිදුවූ පාඩුව රු.618,750 ක් විය.2019 වර්ෂයට විදුලි උපකරණ මිලදී ගැනීමේදී 50 W Street කෝබ්‍රා LED බල්බ, බටය සහ අල්ලුව සමඟ කට්ටල 90 ක් හා 15w LED බල්බ 10035 ක් තාක්ෂණ ඇගයීම් කමිටු තීරණයක් නොමැතිව මිලදීගෙන තිබූ අතර අඩුම මිලකට මිල ගණන් ලැබී තිබියදී වැඩි මුදලකට මිලදී ගැනීම නිසා අයිතම 02 න් වූ මුළු පාඩුව රු.71,385ක් විය.තවද 1/044 වයර් රෝල් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇඟයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගෙන නොතිබීම නිසා එයින් රු.11,985 ක පාඩුවක් සිදුවී අතර සමස්ථයක් වශයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) විධිවිධානවලට පටහැනිව මෙම මිලදී ගැනීම් කර තිබුණි. | කඩිනමින් විසඳිය යුතු ප්‍රශ්නයක් නිසා සාම්පල් පරීක්ෂා කරන ලෙස වැඩ අධිකාරිගේ නිර්දේශය අනුව සභාපතිගේ අනුමැතිය අනුව මිලදී ගැනීම සිදු කරන ලදී. | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවේ අනුමැතිය මත මිලදී ගැනීම් සිදු කළ යුතුවේ. |

3.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

--------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කණුවන සමගි මාවත 1 වන පටුමඟ සංවර්ධනය කිරිමේ 1 වන අදියර සඳහා පිළිවෙලින් රු.3,866,537 ක් හා රු.2,228,787 ක් ගෙවීම් කර තිබුණි.රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 හා 2.4.1 ප්‍රකාරව මේ සඳහා ජාතික වශයෙන් ලංසු කැඳවීමක් සිදු කර ප්‍රසම්පාදන කමිටු හා | කඩිනමින් නිම කළ යුතු ව්‍යාපෘතියක් බැවින් ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරීමට නොහැකි වූ අතර අප විසින් කපන ලද ස්ථානවල | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන අනුව කටයුතු කළ යුතු අතර නියමිත ප්‍රමිතියට අනුව ව්‍යාපෘතිය නිම කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | තාක්ෂණික ඇගයීම් කමිටු මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර නොතිබුණි. මේ සඳහා ලංසු සුරක්ෂණය, කොන්ත්‍රාත්කරුට අවසාන මුදල් ගෙවූ දින වන 2020 මාර්තු 27 දිනෙන් පසු 2020 මැයි 18 දින 2020 මාර්තු 08 දින යෙදූ චෙක්පතක් ලැබී තිබුණි. මීටර් 0.225 ක් උසට ඝන මීටර් 235 ක රෙඩි මික්ස් කොන්ක්‍රීට් යෙදූ බවට ගෙවීම් කර තිබුණද 2020 ජුනි 12 දින විගණනය විසින් ලබා ගත් කොන්ක්‍රීට් හරස් කැපුම් 04 ක සාමාන්‍ය උස මීටර් 0.191 ක් විය. ඒ අනුව ගණනය කිරීමේදී යොදා තිබූ කොන්ක්‍රීට් ප්‍රමාණය ඝන මීටර් 200.28 ක් වූවද ඝන මීටර් 33.72 කට වැඩිපුර ගෙවූ මුදල රු.565,148 ක් විය. 02 වන අදියරේ වූ මාර්ගයේ එක් කොටසක් වන දිග මීටර් 35 ක්, 1 වන අදියරේදී කොන්ක්‍රීට් කර තිබූ බැවින් 2 වන අදියරේදී රු. 949,539 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අගල් 09 ට තිබූ බවත් වාර්තා කරමි | |
| (ආ) | කඳාන ප්‍රධාන කාර්යාල භූමියේ ඉදිරිපස වැට නවීකරණය කිරීම, මාසයකින් ඉටු කිරීම සඳහා සමිතියක් සමඟ රු.977,160 ක වටිනාකමකට 2020 මාර්තු 08 දින ගිවිසුම් ගතවී තිබුණි.කර්මාන්තයේ වැඩ විෂය අංක 02 අනුව අඩි 9'.10" දිග ප්‍රමාණයට වැට සෑදීම සඳහා යකඩ අඩි 134 ක් වැය වන බව පවසා හතරැස් යකඩ බාර් දික් අඩියක් වෙනුවෙන් රු.2,875 බැගින් පිරිවැය ගණනය කර තිබුණද 2020 ඔක්තෝබර් 05 දින භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි 9' 10" දිග වැට සඳහා යකඩ දික් අඩි 96 ක් පමණක් යොදා තිබුණි. ඒ අනුව එක් දික් අඩියක් සඳහා වැය වන සම්පූර්ණ පිරිවැය රු.2,258 ක් වූ බැවින් වැඩිපුර ගෙවූ මුදල වූ රු.122,412 ක් විය. විගණන විමසුමෙන් පසු රු.84,944 ක් නැවත අය කර තිබුණද ඉතිරි මුදල අය කර නොතිබුණි. වැට නිර්මාණය කිරීමේදී යකඩ වැඩ හා කම්කරු ශ්‍රමය සඳහා සම්පූර්ණ වැඩිපුර ගෙවීම රු.142,754 ක් වූ අතර සාවද්‍ය ලෙස අධි ඇස්තමේන්තු පිළියෙල කර ඒවා පදනම් කරගෙන ගෙවීම් කිරීමට සහාව කටයුතු කර තිබුණි. | මෙම කර්මාන්තය සඳහා සත්‍ය වශයෙන්ම වැඩිපුර ගෙවීම් කර ඇති රු. 84,235 ක මුදල අය කර ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. | සාවද්‍ය ලෙස අධි ඇස්තමේන්තු පිළියෙල කර ඒවා පදනම් කරගෙන ගෙවීම් කිරීම නොකළ යුතුවේ. |